කාර්යාලය
அலுவலகம்
Office: 011-2186055

ලේකම්
செயலாளர்
Secretary: 011-2186057

ෆැක්ස්
பெக்ஸ்
Fax: 011-2187249

# කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය

மகளிர்இ சிறுவர் அலுவல்கள்மற்றும் உலர்வலய அபிவிருத்திஅமைச்சு

**Ministryof Women & Child Affairs and Dry Zone Development**

ඊමේල්/மின் தபால் / Email: secycdwa@gmail.com
වෙබ් අඩවිය/,izaj;jsk; / Website:www.childwomenmin.gov.lk

මගේ අංකය.
எனது இல.
My No. MWCA/02/05/16/20/9/2/12

ඔබේ අංකය.
உமது இல.
Your No.

දිනය.
திகதி.
Date 2019.03. 14

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**<u>කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශයේ</u>**

**<u>උපදේශන සහකාර නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා අයදුම්පත් කැඳවීම - 2020</u>**

ඒකාබද්ධ සේවා චක්‍රලේඛ 03/2018 අනුව කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශයට අනුයුක්තව දැනට දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන උපදේශන සහකාර නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් - 2020 සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. සියලුම අයදුම්පත් මේ සමග ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව ( ඇමුණුම් 01) සකස් කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඔබගේ නිර්දේශ සමග 2019.04.22 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් මා වෙත එවීමට සැලැස්විය යුතු අතර, එදිනෙන් පසු ලැබෙන කිසිදු අයදුම්පතක් සැලකිල්ලට භාජනය කරනු නොලැබේ.

03. වසර 05ක් හෝ ඊට වැඩි කාලයක් එකම සේවා ස්ථානයක සේවය කර ඇති උපදේශන සහකාර නිලධාරීන් විසින් අනිවාර්යයෙන්ම අයදුම්පත් යොමු කළ යුතුය.

04. ස්ථාන මාරුවීමට අපේක්ෂාවෙන් සිටින සහ මින් පෙර කිසිදු ස්ථාන මාරුවීමක් ලබා නොමැති නිලධාරීන් සඳහා ප්‍රමුඛස්ථානයක් ලබා දෙන අතර ඉතා ප්‍රියමනාප, ප්‍රියමනාප, ප්‍රියමනාප නොවන සේවා ස්ථාන, ස්ථිර පදිංචිය තිබූ /ඇති ස්ථානයේ සිට සේවා ස්ථානයට ඇති දුර ප්‍රමාණය පදනම් කරගෙන වර්ගීකරණය කරනු ලබයි.

I ඉතා ප්‍රියමනාප සේවා ස්ථාන :-

ස්ථිර පදිංචිය තිබූ/ඇති ස්ථානයේ සිට සේවා ස්ථානයට ඇති දුර කි.මී 25 ට අඩු නම් එම සේවා ස්ථාන ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයක් වේ .

II ප්‍රියමනාප සේවා ස්ථාන :-

ස්ථිර පදිංචිය තිබූ/ඇති ස්ථානයේ සිට සේවා ස්ථානයට ඇති දුර කි.මී 25-50 අතර නම් එම සේවා ස්ථානය ප්‍රියමනාප සේවා ස්ථානයක් වේ .

III ප්‍රියමනාප නොවන සේවා ස්ථාන :-

ස්ථිර පදිංචිය තිබූ/ඇති ස්ථානයේ සිට සේවා ස්ථානයට ඇති දුර කි.මී 50 ට වැඩි නම් එම සේවා ස්ථානය ප්‍රියමනාප නොවන සේවා ස්ථාන වේ .

05. අදාළ නිලධාරින්ගේ අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී එහි සඳහන් තොරතුරුවල නිරවද්‍යතාවය පෞද්ගලික ලිපි ගොනුව අනුව තහවුරු කර ඔබගේ නිර්දේශය සමග ඉදිරිපත් කරන්නේ නම් මැනවි.

06. අවශ්‍ය නිලධාරීන් ගණන ඉක්මවා කිසිදු හේතුවක් මත ස්ථාන මාරුවීම් ලබා නොදෙන බව ද, අතිරික්ත වන සේ නිලධාරීන් මාරු කිරීමෙන් අමාත්‍යාංශයේ කටයුතුවලට බාධා පැමිණෙන බැවින් එවැනි මාරුවීම් සිදු කරනු නොලබන බව ද කාරුණිකව දන්වමි.

07. ස්ථාන මාරුවීම් ලබා ගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමට මෙම අමාත්‍යාංශය මගින් ඔබ දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අනුයුක්ත කර ඇති උපදේශන සහකාර නිලධාරීන් දැනුවත් කරන්නේ නම් මැනවි. මෙම තොරතුරු අමාත්‍යාංශ වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත. (http://www.childwomenmin.gov.lk)

ඩී.එස්.විජේසේකර

අතිරේක ලේකම්(පාලන)

ලේකම් වෙනුවට